# අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත රාජ්‍ය සේවයෙන් තාවකාලිකව ද්විතීයන පදනම මත නිලධරයන් හා සේවා නියුක්තයන් පත්කර ගැනීම

CIABOC

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත යටතේ ස්ථාපනය කරන ලද පූර්ණ ස්වාධීන ආයතනයකි. දූෂණ විරෝධී පනතේ 26(5) හා 26(6) වගන්ති ප්‍රකාරව කොමිෂන් සභාව වෙත තාවකාලිකව (ද්විතීයන පදනම මත) නිලධරයන් හා සේවා නියුක්තයන් පත්කරගැනීම සිදුකරනු ලබන අතර, බඳවා ගනු ලබන තනතුරු පහත පරිදි වේ.

| තනතුර | | බඳවා ගනු ලබන සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අධ්‍යක්ෂ (පැමිණිලි කළමනාකරණ) | 01 |
| 2 | අධ්‍යක්ෂ (දූෂණ නිවාරණ) | 01 |
| 3 | අධ්‍යක්ෂ (වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීම) | 01 |
| 4 | අධ්‍යක්ෂ (අන්තර් ජාතික සබඳතා හා පර්යේෂණ) | 01 |
| 5 | අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) | 01 |
| 6 | නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (පැමිණිලි කළමනාකරණ) | 02 |
| 7 | නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (මාධ්‍ය) | 01 |
| 8 | නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන) | 01 |
| 9 | නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (සැපයුම් සහ නඩත්තු) | 01 |
| 10 | නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (මුදල්) | 01 |
| 11 | නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (සැලසුම් සහ පුහුණු) | 01 |
| 12 | නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීම) | 01 |
| 13 | නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) | 01 |
| 14 | පරිපාලන නිලධාරී | 01 |
| 15 | තොරතුරු තාක්ෂණ නිලධාරී | 01 |
| 16 | තොරතුරු තාක්ෂණ සහකාර | 06 |
| 17 | භාෂා පරිවර්තක/ භාෂණ පරිවර්තක | 02 |
| 18 | පුස්තකාලයාධිපති | 01 |
| 19 | දූෂණ විරෝධී කළමනාකරණ නිලධාරී | 27 |
| 20 | යතුරු ලේඛක හා ළඝු ලේඛක | 11 |
| 21 | සන්නිවේදන සහකාර | 04 |
| 22 | රියදුරු | 20 |
| 23 | කාර්යාල සහායක | 26 |

- තෝරාගනු ලබන නිලධාරීන්ට එම නිලධාරීන්ගේ නිත්‍ය සේවයට/ තනතුරට අදාළ වැටුප් සහ දීමනාවන් ඒ ආකාරයෙන්ම සහ මූලික වැටුපෙන් 25% ක ද්විතීයන දීමනාවක් හිමිවේ.
- ද්විතීයන පදනමෙන් බඳවා ගන්නා නිලධාරීන්ට රාජ්‍ය සේවයේ හිමි කිසිදු වරප්‍රසාදයක් අහිමි නොවන අතර, අදාළ කාලය එම නිලධාරියාගේ හෝ සේවකයාගේ උසස්වීම් හා විශ්‍රාම වැටුප් ඇතුළු ඕනෑම කාර්යයක් සඳහා සක්‍රිය සේවා කාලයක් ලෙස සැලකේ.
- වැඩිදුර තොරතුරු සහ අයදුම්පත්‍රය අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය ciaboc.gov.lk මගින් බාගත කරගත හැකිය.
- අයදුම්පත් භාරගන්නා අවසන් දිනය 2026 ජනවාරි මස 14 වන දින වේ.

**(මෙම සියලුම බඳවා ගැනීම් ද්විතීයන පදනම මත වන අතර, දැනට රාජ්‍ය සේවයේ සිටින අදාළ සුදුසුකම් සපුරාලන අය විසින් පමණක් අයදුම්පත් යොමුකළ යුතුවේ.)**